# ශ්‍රී ලාංකික සාහිත්‍ය කරුවා හා යුදබිමේ සොල්දාදුවා

## කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

ශ්‍රී ලාංකික සාහිත්‍ය කරුවා හා යුධබිමේ සොල්දාදුවා

ඉහත වැකිය මා උපුටා ගත්තේ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවෘත්තියකිනි. එහි කතුවැකියේ පෙන්වාදීමට උත්සාහකර තිබුණේ වසර තිහක් පුරා පැවති ශ්‍රී ලංකාවේ ජනවාර්ගික යුද්ධයත් සමඟින් සාර්ථක යුධමය සාහිත්‍ය කලාවක් අප රටේ නිර්මාණය නොවූ බවය. එම කතුවැකිය ආරම්භකර තිබුණොත්, රුසියන් චරිතය, නමැති රුසියානු සාහිත්‍යයෙන් බිහිවූ කෙටිකතාවේ සංක්ෂිප්ත විස්තරයක් සමඟිනි. එම කෙටිකතාවේ කතා නායකයා යුද්ධයේදී තුවාල ලබා ශල්‍ය කර්ම ගණනාවකට භාජනය කිරීමෙන් අනතුරුව සුවය ලබන්නේ විකෘති පෙනුමක් ඇති මිනිසෙකු හැටියටය. එම විකෘති පෙනුමේ බෑරෑරුම්කම කොපමණ දැයි කිවහොත් ඔහුට ප්‍රතිකාර කරන, මුහුණ බලන්නට ඔහුට කණ්ණාඩිය ලබාදෙන හෙදිය එම සෙබළා කෙරේ අනුකම්පාවෙන් හඬා වැටේ. විකෘති පෙනුමෙන් නිවසට යන්නට මැලිවන හේ තමාගේම මිතුරෙකු හැටියට රඟමින් තම පෙම්වතිය හා මවුපියන් බැහැදකින්නට යයි. ඔවුන් සියල්ලන්ම එම විකෘති පෙනුමෙන් කැළඹෙති. එහෙත් පසුව ඔවුහු සියල්ලෝම හේ තම පෙම්වතා හා පුත්‍ර බව හඳුනාගනිති. කෙතරම් විකෘති වුවත් රට වෙනුවෙන් කැපවුණු පෙම්වතකු හා පුතෙකු සිටීම ගැන තමන් ආඩම්බර වන බව ඔවුහු ප්‍රකාශ කරන අතර, නැවත සෙබළා පෙම්වතකු ලෙසද දයාබර පුතෙකු ලෙසද ඔවුන් අසළට යයි.

මෙම කතුවැකියෙන් පෙන්වා දී ඇත්තේ වසර 30ක් පුරා ජයග්‍රහණයට උරදුන් සෙබළුන් වෙනුවෙන් ජයග්‍රාහී යුදමය සාහිත්‍යයක් බිහි නොවුවා සේම, අඩුතරමින් ඒ පිළිබඳව සාහිත්‍යයක් ගොඩනැගීමට තරම්වත් අප රටේ ප්‍රවීන සාහිත්‍යකරුවන් කිසිවෙක් උරනොදී ඇති බවය. යුද්ධය අතගාමින්, සම්මාන දිනාගැනීමට නැත්නම් එම නිර්මාණ අලෙවිකරගැනීම සඳහා නිර්මාණ බිහි කළාට, ඒ පිළිබඳව සැබෑ සාහිත්‍යයක් ගොඩනගන්නට ඔවුන් උත්සාහ නොකළ බවය.

එසේම මෙම කතුවැකිය තුළින් ඔහු මතක් කර දී ඇත්තේ අප රටේ ජනතාවට යුද්ධය දිනූ වීරයා කෙමෙන් අමතක වන ආකාරයයි. ආරක්ෂක අමාත්‍යාංශයේ තොරතුරු වලට අනුව, අපි වෙනුවෙන් අපි, අරමුදලට වෙනදා මෙන් ආධාර නොලැබෙන්නේය යන දුක් ගැනවිල්ලයි. දැන් එයට මුළු සමස්ත ජනගහනයෙන්ම ලැබෙන්නේ මසකට රු. 30,000 වැනි සුලු මුදලක් බවයි.

ඉහත සඳහන් කිරීම් වලට අනුව අපරටේ සාහිත්‍යකරුවා යුධ බිමේ වීරත්වය තුළින්, ප්‍රෞඪ වීරත්වය ඉස්මතු කරමින් සාහිත්‍යකලාවන් බිහි නොකළේ ඇයි? එයට වගකිව යුත්තේ සොල්දාදුවාට වරින්වර කුඩම්මාගේ සැළකිලි ලබාදෙමින් වසර 30ක කාලයක් පිල්මාරු කළ අප රටේ දේශපාලනයයි. එසේම මෙම යුද්ධය මෙම පොළොවේම උපන් දෙපිළක් අතර කළ සටනකි. නායකත්වයටත්, යුධ හමුදාපතිවරුන්ටත් අවශ්‍ය ආකාරයට සෙබළාව බිල්ලට දුන් ජයග්‍රහණයක් නොදකින යුධ මානසිකත්වයක් කරා රටේ ජනතාවත්, සෙබළුත් (මෑතකදී යුද්ධය දිනනතුරු) එහාට මෙහාට දෝලනය කළේ අප රටේ දේශපාලනයයි. වරෙක එම දේශපාලකයාට ත්‍රස්තවාදියා සටන් කාමියෙක් විය. නැත්නම් ගරිල්ලා නායකයෙක් විය. එසේත් නැත්නම් විමුක්ති වාදියෙක් විය. සටන් විරාම ගිවිසුම් කාලයට සෙබළා නිකම්ම අංක තහඩු සහිත සෙබළෙකි. එක් නායකයෙකු මේ අහිංසක සෙබළුන් දහස් ගණනක් අමු අමුවේ ත්‍රස්තවාදීන්ට බිලිදුන්නේ ආයුධත් සමඟිනි.

*මහින්ද රජයෙන් මේ වනතුරු දෙමළ ජනයා වෙනුවෙන් පැහැදිලි යමක් නිර්මාණය වී නැත. "කුරිරු ප්‍රභාකරන් සමඟ අහිංසක දෙමළ ජනයාද මිය ගියා." යනුවෙන් වත්මන් දෙමළ දේශපාලකයන් කෑමොර දෙන්නේ එහෙයිනි.*

එහෙයින් මෑතක් වනතුරුම අප රටේ සාහිත්‍යකරුවාට අවශ්‍යව තිබුණේ, මිලියන් ගණනක් මුදල් අපතේ යවන, බිලියන් ගණනක් කොමිස් කාක්කන්ට යන සමහර දේශපාලඥයන්, යුධ නායකයන් ව්‍යාපාරයක් කරගෙන තිබූ දූෂණය ඉහවහා ගිය මෙම යුද්ධය නවත්වාගෙන, අහිංසක සෙබළුන්ගේ ජීවිතය බේරාගෙන මෙම අනර්ථකාරී යුද්ධය කෙසේ හෝ නවත්වා ගැනීමයි. පුහු වීරත්වය ඔප දමමින් දහස් ගණන් අහිංසක දෙමළ තරුණ තරුණියන් බිල්ලට දුන් ප්‍රභාකරන් කෙනෙකු සිංහල වර්ගයා තුළින් බිහිකිරීමට ඔවුනට ඕනෑතරම් අවකාශ තිබුණ නමුදු අවංක සාහිත්‍යකරුවෙකු එදා පැවති දේශපාලන කක්කුට්ටන්ට ප්‍රශස්ති ගී ගායනා කිරීමට මැළිකමක් දැක්වූයේ මේ හේතු කාරණා නිසාය. මන්ද ? යුද්ධයට වාසියට ගයන හැම ගීතයකමට දායක වන හුරේ පාරින් වාසි ලබන්නන් අපරටේ දේශපාලකයන් නිසාය.

නියම අවංක වීරයන් ජීවත්වන්නේ ජනතාවගේ හදවත් තුළය. වසර 30 ක පුරාවට කොටි සංවිධානය දෙමළ වීර සාහිත්‍යයක් නිර්මාණය කළේය. ලෝකය පුරා සිටින කොටි සංවිධානයේ ඒජන්තවරු, කොටි ජයග්‍රහණ වල චිත්‍රපට නිර්මාණය කළෝය. ගීත කාව්‍යය චිත්‍ර සේම පැය විසිහතර පුරාවටම ඔවුන්ගේ නාලිකාවල විකාශය වූයේ වෙනම රටක සිහිනයයි. එහෙත් කොටි සංවිධානය ජයග්‍රහණය කළාද? නැත. ඔවුන්ගේ වීර සාහිත්‍යය දෙමළ ජනතාව අතරට ගියත් කොටි සංවිධානයට ජයග්‍රහණය කිරීමට නොහැකිවිය. ඒ සියල්ලන්ටම වඩා මහින්ද රාජපක්ෂගේ දේශපාලන නායකත්වය ප්‍රබල වූයේ, නිවැරදි යුද්ධයකට දේශපාලන නායකත්වය කෙතරම් දුරට ඉවහල් වනවාද යන්න කදිමට කියා පවසමිනි. එහෙත් එම වීරත්වය දිගටම රැකගැනීමට මහින්දට සේම ඔහුගේ යුධ හමුදාපතිවරයා වූ සරත් පොන්සේකාට නොහැකි වූයේ බල ලෝභය නිසාය. ජනතාවගේ පපු කැනත්තට කිඳා බැස තිබූ වීරත්වය දෙපලු වූයේ ඔවුන්ගේ විරසකයයි. එසේම විදේශවල ජීවත්වන හැකි පමණින් ශ්‍රී ලංකාවේ ආබාධිත සෙබලුන්ට උදව් උපකාර කරන ශ්‍රී ලාංකිකයෙකු මට මෙසේ පැවසීය.

මිලියන් ගණන් මුදල් ඡන්ද පෝස්ටර් වලට වැයකරන ලක්ෂ ගණන් මුදල් ගෙවා රූපවාහිණී නාලිකාවලට දැන්වීම් ලබාදෙන, ලක්ෂ ගණනක් මුදල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සැප පහසු කාර්ය සඳහා වෙන්කරන , කෝටිගණන් මුදල් පිටරට බැංකු වල තැන්පත් කරන දේශපාලකයන් සිටින රටකට එම මුදල් අහිංසක සෙබලුන්ගේ සුභසාධනය සඳහා වැය කරන්නට බැරිද? සොල්දාදුවා අමතක නොකට ඔහුගේ සුභසාධකය සඳහා නැවත ඉදිරිපත් වන්නැයි ජනතාවට ආයාචනා කරන ආරක්ෂක ලේකම්වරයාට මේ ටික මේ අමන දේශපාලකයන්ට කියන්නට බැරි ඇයි?" යුද්ධයේ ජයග්‍රහණයත් සමඟ විරිඳු බයිලා කියමින් බොළඳ සාහිත්‍යකරුවන් විශාල පිරිසක් මහින්ද රජය වටා එක් රොක් වුවත් ජනාධිපති මන්දිරයට ගොසින් පිටපතක් පිළිගන්වා ඔහුගේ ආශිර්වාදය ලබාගත්තත් ජනතාවට එම සාහිත්‍යය දිරවන්නේ නැත .

ජනතාවගේ මනසට එයින් ලැබෙන දෙයක් ද නැත. ඉක්මනටම සියල්ල අමතක වන ජනතාව සිටින රටකට අවශ්‍ය යථාර්ථවාදී සාහිත්‍යයක් ගොඩනැගීමට නම් එය කළ යුතු වන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොර සියලුම ජනතාවට රසවිඳිය හැකි ජනතාවාදී සාහිත්‍යය කතිකාවත් තුළිනි. ඒ මන්ද කියතොත් මේ යුද්ධයට සේම ප්‍රභාකරන්ටද එරෙහිවූ විශාල දෙමළ ජනතාවක් අපත් සමඟ ජීවත්වන නිසාය. මේ සියල්ලන්ටම අවශ්‍ය වීර සාහිත්‍යයක් සේම සොල්දාදුවාට ඇලුම්කරන ජාතිවාදී නොවන දේශයක් දැන් අප ගොඩනැගිය යුතු නිසාය. යුද්ධය දිනූ ලොවේ රටවල් වල තවමත් බෝම්බ පිපිරේ. එහෙත් අපරටේ එවැනි දෙයක් සිදු නොවන්නේ දේශයට ආදරය කරන සිංහල නොවන ජනතාවක් අප සමඟ සහෝදරත්වයෙන් ජීවත්වන නිසාය . මේ කුරිරු යුද්ධයෙන් සිංහල සින්දු කියන නළලේ තිලක තියන කිරිල්ලියෝද දෙමළ ජනතාව වෙනුවෙන් මිය ගියාහ.

එහෙත් මහින්ද රජයෙන් මේ වනතුරු දෙමළ ජනයා වෙනුවෙන් පැහැදිලි යමක් නිර්මාණය වී නැත. "කුරිරු ප්‍රභාකරන් සමඟ අහිංසක දෙමළ ජනයාද මිය ගියා." යනුවෙන් වත්මන් දෙමළ දේශපාලකයන් කෑමොර දෙන්නේ එහෙයිනි. කාර්වල මිල අඩුකිරීමට පෙර ව්‍යවස්ථාව වෙනස්කරමින් තෙවන වතාවටක් විධායක ජනාධිපතිවරයා ලෙස පත්වීමට මානබලමින් පිඹුරුපත් සකස් කිරීමට පෙර ඔහුට තව කළ යුතු දෑ බොහෝ තිබේ. නිවැරදි දර්ශනයක් තුළින් අලංකාරවත් වීර සාහිත්‍යයක් අපට නිර්මාණය කළ හැකිය, යන්න මාගේ අදහසයි. එවැනි රටකට ආරක්ෂක ලේකම්වරයාට පිංකැට හොල්ලමින් යාමට අවශ්‍ය නැත. තමන්ගේ මුළු සේසතම රැගෙන පිංකැටය අසලට ජනතාව එනු ඇත . ■


ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා



Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

DENTIST

Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

Sannasa

1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760

LANKAN AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886
9798 2200
14/30 Tower Court
Noble Park 3174